සැ. යු. - 2017.05.12 වැනි දින පළ වූ අංක 2019 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,020- 2017 මැයි මස 19 වැනි සිකුරාදා - 2017.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 940 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 941 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 944 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 956 |


සැ. යු. -(i) ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 මැයි මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මැයි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **නෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 ජූනි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මැයි මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ලංසු සඳහා ආරාධනයයි (IFB)**

ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

කොටුව දුම්රිය ස්ථානයේ යෝජිත නානකාමර (Wash Rooms) ඉදිකිරීම

ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත විස්තර කොට ඇති පරිදි කොටුව දුම්රිය ස්ථානයේ යෝජිත නාන කාමර ඉදිකිරීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

කඩා ඉවත් කිරීමේ වැඩ, කැණීම් සහ පස් වැඩ, කොන්ක්‍රීට් වැඩ, පෙදරේරු වැඩ, ව්‍යුහගත ලෝහමය වැඩ, නිමා කිරීමේ වැඩ, වහලය ආවරණය කිරීමේ වැඩ, ජලනළ වැඩ, විදුලි වැඩ, යාන්ත්‍රික වැඩ, පිරිවිතර සැළසුම් හා ප්‍රමාණ පත්‍ර අනුව සියලුම ද්‍රව්‍ය හා ශ්‍රමිකයන් සැපයීම මෙම කර්මාන්තයට අඩංගු වේ.

02. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුයි.

- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) කලින් (ICTAD) ආයතනයේ ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා සී 05 ශ්‍රේණියේ හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචි වී සිටීම.

- පසුගිය වසර තුන ඇතුළත සමාන සංකීර්ණත්වයෙන් යුත් අවම වශයෙන් එක් ව්‍යාපෘතියක් ඉටුකිරීමේ පළපුරුද්ද ලබා තිබීම.

03. රු. 5000.00 ක් පමණක් වන ආපසු ගෙවනු නොලබන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2017.06.01 වැනි දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිවල ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාරගැනීම 2017.06.02 වැනි දින ප.ව. 2.00 ට අවසන් කෙරේ.

05. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

06. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපැල් මගින් එවිය යුත්තේ හෝ අතින් ගෙනැවිත් භාරදිය යුත්තේ :

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
තැ.පෙ. 1347, ඕල්කොට් මාවත,
කොළඹ 10.

07. කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැක.

දුරකථන අංක : 2438078/ 2436818
ෆැක්ස් අංකය : 2432044, ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
(මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7485

05-478

---

**මහාධිකරණය - කළුතර**

කළුතර මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන පානදුර මහෙස්ත්‍රාත් අධිකරණය හා හොරණ මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා 2017.06.02 වැනි දින ප. ව. 1.30 දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ.

02. ආපසු නොගෙවන ලද රු. 200 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා නියමිත ආකෘති පත් හා විස්තර කළුතර මහාධිකරණ ගිණුම් අංශයෙන් ලබාගත යුතු ය.

03. ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ 2017.06.01 වැනි දින ප. ව. 1.30 දක්වා පමණි.

04. ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතුව 2017.06.02 වැනි දින ප. ව. 12.30 ට පෙර තැන්පත් කළ යුතු ය.

05. ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුවක් ද අධිකරණයේ තැන්පත් කළ යුතු අතර, අදාල උපලේඛනයේ දක්වා ඇත. ටෙන්ඩර් පත්‍රයේ පිටපත් දෙක සමග මුදල් ගෙවන ලද කුවිතාන්සි ඡායා පිටපත් ද අමුණා එවිය යුතු අතර, ටෙන්ඩර් පත් ලිපිකවරයේ ඉහළ වම් කෙළවරේ **''වාහන සඳහා මිළ ගණන් 2017''** වාහන අංකය .................. යනුවෙන් සඳහන් කර කළුතර මහාධිකරණයේ ගණකාධිකාරී වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අතින් ගෙනවිත් භාරදෙනු ලබන ටෙන්ඩර්පත් ගණකාධිකාරී ඉදිරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකි ය.

06. වාහන පරීක්ෂා කිරීම සඳහා 2016.05.31 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල දී රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව කාර්යාල වේලව තුළ දී පරීක්ෂා කළ හැකි ය.

07. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකි අතර, 2017.06.02 වැනි දින ප. ව. 1.30 ට කළුතර මහාධිකරණයේ දී කලාපීය ප්‍රසම්පාදන කමිටුව මගින් ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

08. ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දීම ලැබී දින 03ක් ඇතුලත සම්පූර්ණ වටිනාකම මුදලින් ගෙවා වාහන ඉවත් කරගත යුතු ය.

09. ටෙන්ඩර් භාරගැනීම, විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම පිළිබඳව බලතල ටෙන්ඩර් මණ්ඩලය සතු වන අතර, මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 034-2222486 ඔස්සේ කළුතර මහාධිකරණයේ ගණකාධිකාරී වෙතින් ලබාගත හැකි ය.

| *නඩු අංකය* | *වර්ගය/මාදිලිය* | *වාහන ලියාපදිංචි අංකය* | *ඇප තැන්පතුව* | *වාහන පරීක්ෂා කළ හැකි ස්ථානය* |
|---|---|---|---|---|
| | මෝටර් රථය | WPKD 6761 | 10,000 | පානදුර මහාධිකරණය |
| | ද්විත්ව ප්‍රයෝජන කැන්ටර් රථය | 52-8054 (අබලි ලෙස) | 5,000 | පානදුර මහෙස්ත්‍රාත් අධිකරණය |
| | ලොරි රථය | 227-1420 (අබලි ලෙස) | 5,000 | පානදුර මහෙස්ත්‍රාත් අධිකරණය |
| | මෝටර් ට්‍රයිසිකල් | WPYL 5613 | 2,000 | පානදුර මහෙස්ත්‍රාත් අධිකරණය |
| | මෝටර් ට්‍රයිසිකල් | WP AAK 5588 | 5,000 | පානදුර මහෙස්ත්‍රාත් අධිකරණය |
| | ද්විත්ව ප්‍රයෝජන(TATA ACE) | WP PS 0359 | 5,000 | පානදුර මහෙස්ත්‍රාත් අධිකරණය |
| | ලොරි රථය | SG LD 1439 | 10,000 | මතුගම මහෙස්ත්‍රාත් අධිකරණය |
| | මෝටර් ට්‍රයිසිකල් | JY 9382 | 1,000 | කැස්බෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය |
| | ලොරි රථය | LB 9573 | 5,000 | කැස්බෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය |
| | මෝටර් ට්‍රයිසිකල් | YQ 7200 | 5,000 | කැස්බෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය |
| | මෝටර් සයිකල් | QR 6931 | 5,000 | කළුතර මහෙස්ත්‍රාත් අධිකරණය |

කේ. බී. කේ. හිරිඹුරේගම,
මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
කළුතර.

2017 මැයි මස 02 වැනි දින,
කළුතර මහාධිකරණයේ දී ය.

05-676

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2017/2018 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2017 ජූලි මස 01 වැනි දින සිට 2018 ජූලි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙන් දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් (15%) වටිනාකමට ලබාගත් වත්කම් සහතිකයක් ද ඊට ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක................. දරන ............. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් කර ප්‍රාදේශීය ලේකම්, හලාවත වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. 2017 වර්ෂය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2017.05.25 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය හැකි ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වන රා තැබෑරුම් නැවත විකිණීම 2017.06.30 වැනි දින පෙ.ව 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩරය ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
(දුරකථන අංකය : 032-2223205/032-2222138).

ඩී. එම්. ඒ. කේ. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
හලාවත.

2017 මැයි මස 03 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
හලාවත.

**උපලේඛනය**

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා අවසන් දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 01 | හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 02 දරන කොට්ඨාසය | ඉච්චම්පිටිය | 2017.05.25 පෙ.ව. 10.30 | 2,000 0 |
| 02 | හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 03 දරන කොට්ඨාසය | කොට්ඨාසය තුළ වෙනත් සුදුසු ස්ථානයක් සොයා ගත යුතු ය | එම | 1,000 0 |
| 03 | උතුරු පිටිගල් කෝරළේ | ඔළිඳළුව | එම | 250 0 |

05-521

**මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2017 ජූලි මස 01 වැනි දින සිට 2018 ජුනි මස 30 දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම - 2017/2018 වර්ෂය

2017 ජූලි මස 01 වැනි දින සිට 2018 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව, එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

(2) සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ම ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් කළ යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිළ ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% ට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

(3) විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනත වම් කෙළවරෙහි "අංක............................................ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන්, පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2017.05.23 දින පෙ.ව. 10.30 ට පෙර මහවැව ප්‍රාදේශීය ලේකම් ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

(4) ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

(5) 2017.05.23 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

(6) පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2017.06.13 දින පෙ.ව. 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

(7) මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය. (දුරකථන අංකය : 032 -2254231).

ශ්‍රීමාලි මල්ලවආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
මහවැව.

2017 අප්‍රේල් මස 21 වැනි දින,
මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *රා තැබෑරුම් අංකය* | *ග්‍රාමය* | *තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|
| 16 | අඩප්පරගම | 500 0 |
| 17 | මට්ටාකොටුව | 500 0 |
| 18 | තොඩුවාව (උතුර) | 1,000 0 |

05-600

# රජයේ නොවන දැන්වීම්

## සමාගම් ඒකාබද්ධ කිරීම පිළිබඳ දැන්වීම

කොග්ගල මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 4099), ලීඩිං ලේඩි ඉන්ටිමේට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 66709), එස් ජී අයි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 4350), ෆෙයාමවුන්ට් ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 78001) ඇලයර් ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 15944) සහ ෆෙයාමවුන්ට් ෆැෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 77994) යන සමාගම් ස්ටා(ර්) ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 7213) සමාගමට ඒකාබද්ධ කිරීම.

කොග්ගල මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ්, ලීඩිං ලේඩි ඉන්ටිමේට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, එස් ජී අයි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, ෆෙයාමවුන්ට් ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඇලයර් ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ෆෙයාමවුන්ට් ෆැෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් ස්ටා(ර්) ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 7213) යන සමාගමට ඒකාබද්ධ කර ඇති බවටත් ඒකාබද්ධිත සමාගම වනුයේ ස්ටා(ර්) ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 7213) යන සමාගම බවටත් 2007 අංක 7 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒකාබද්ධ කිරීම බලාත්මක වන දිනය වනුයේ 2017 අප්‍රේල් මස 05 වන දින ය. ඒකාබද්ධිත සමාගමේ ලියාපදිංචි ලිපිනය වනුයේ 1 A, 5 වන මහල, යුනිටි පෙදෙස, කොළඹ 03 වේ.

මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-424

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය අනුව වගකීම් සීමාසහිත සමාගමක් සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සී. ජී. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 120990
සංස්ථාගත කළ දිනය : 2017 මාර්තු මස 20 වැනි දින
ලියාපදිංචි ලිපිනය : ''ද වේවට්‍රී'' 141/9, වොක්ෂෝල් වීදිය, කොළඹ 02, ශ්‍රී ලංකාව.

සමාගම් ලේකම්වරු.

05-427

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පිළියන්දල, මාම්පේ නැගෙනහිර, මහරගම පාර අංක 91/4 හි ස්ථිර පදිංචි සහ දැනට ඇමරිකා එක්සත් ජනපදය, අංක 89110, නෙවඩා ලාස් වේගාස්, අක 203, ඇම්බර්රිජ්, ස්ත්‍රජන් පටුමග, අංක 316 හි පදිංචි නිශාන්ත පණ්ඩිතරත්න (ජා. හැ. අංක 690893924V) සහ මොරටුවගේ විශාකා දමයන්ති පණ්ඩිතරත්න (ජා. හැ. අංක 748020942 V) යන අය විසින් රොක්ස් ඒනී වර්ක් ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කළ වසර 2015ක් වූ ජුනි මස 19 වැනි දින විදේශ ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 24, තුඩුව පාර, මඩපාත, පිළියන්දල පදිංචි රවින්ද්‍ර ශ්‍රී පණ්ඩිතරත්න (ජා. හැ. අංක 772823088 V) හිමිකරු වෙත බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2017 අප්‍රේල් මස 02 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බවත්, ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව මින් ඉදිරියට රවින්ද්‍ර ශ්‍රී පණ්ඩිතරත්න විසින් එකී ඇටෝර්නි බලකරු ලෙස සිදු කරන ක්‍රියාවන්ට මා හට වගකීමක් නොමැති බව ද මෙයින් දන්වා සිටිනු ලැබේ.

නිශාන්ත පණ්ඩිතරත්න,
මොරටුවගේ විශාකා දමයන්ති පණ්ඩිතරත්න.

2017ක් වූ අප්‍රේල් මස 2 වැනි දින දී ය.

05-428

---

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : බ්‍රිටිෂ් ප්‍රී ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 115308
ලියාපදිංචි දිනය : 2016.07.28
ලියාපදිංචි ලිපිනය : අංක 51/2, හේන පාර, ගල්කිස්ස.

ලේකම්.

05-430

---

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ගුරු ගුනයිට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 121778
ලියාපදිංචි දිනය : 2017.04.21
ලියාපදිංචි ලිපිනය : අංක 27/1, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.

ඩබ්. එස්. වීරමන්,
ලේකම්.

05-431

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහරගම, දඹහේන පාර, සමන්උයන, අංක 2/14 දරන ස්ථානයේ පදිංචි ජා. හැ. අ. 783270048 V හිමි රත්නායක මුදියන්සේලාගේ මලිත ඔසඳ වන මා විසින් පාදුක්ක, පොරෝගෙදර, අංක 21/ඒ හි පදිංචි රත්නායක මුදියන්සේලාගේ සිරිපාල යන අයට ලබාදී ඇති 2011.07.30 වැනි දින අයි. එච්. සෙනරත් ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 1120 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගුකොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිනු ලැබේ.

රත්නායක මුදියන්සේලාගේ මලිත ඔසඳ.

2017 අප්‍රේල් මස 21 වැනි දින දී ය.

05-432

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : වාව් ලංකා හොලිඩේස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : PV 121372
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 176/99, බොල්ගොඩ ගාර්ඩන්ස්, ගල්කනුව පාර, ගොරකාන කෙසෙල්වත්ත, මොරටුව.
ලියාපදිංචි දිනය : 2017.04.03

ඒ. ජේ. එම්. සමන්ත ජයසුන්දර,
සමාගම් ලේකම්.

05-448

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 (1) දරන වගන්තිය යටතේ සමාගමක් සංස්ථාගත කිරීමයි.

සමාගම සංස්ථාගත කළ නාමය : ෆයිව් ෆනැන්ඩෝස් ෆාම්ස් ඇන්ඩ් ඔර්චඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ අංකය : පී වී 119986
සංස්ථාගත කළ ලිපිනය : අංක 111, මීගමුව පාර, පෑලියගොඩ
සංස්ථාගත කළ දිනය : 2017.02.09

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

අංක : SEC/1(b)(1)/2005/3215

05-471

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීමේ නිවේදනය පහත දැක්වෙන පරිදි මෙහි දක්වා ඇත.

සමාගමේ නාමය : ආර්පිකෝ නැචුරල් එක්ස්ට්‍රැක්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 120906
ලියාපදිංචි ලිපිනය : 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.
සංස්ථාගත කළ දිනය : 2017.03.17

රිචඩ් පීරිස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-480/1

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීමේ නිවේදනය පහත දැක්වෙන පරිදි මෙහි දක්වා ඇත.

සමාගමේ නාමය : ආර්. පී. සී. ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 120989
ලියාපදිංචි ලිපිනය : 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.
සංස්ථාගත කළ දිනය : 2017.03.20

රිචඩ් පීරිස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-480/2

---

## 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නිවේදනයයි

වර්ෂ 2017 ජනවාරි මස 03 දින ඔරිජින් ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් සමාගමක් මතුගම, වැත්තෑව, රෝහල පාර, අංක 10 සී යන ස්ථානයේ ස්ථාපිත කර ඇති බැවින් එකී සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 119116 බව ශ්‍රී ලංකාවාසී ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

සංජීව කළුගලආරච්චි,
සමාගම් ලේකම්.

05-481

## නේයිලි ඩේවිස් කන්සල්ටිං ඉංජිනියර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි.

2017 අප්‍රේල් 20 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 121606 යටතේ නේයිලි ඩේවිස් කන්සල්ටිං ඉංජිනියර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය ඩීල් පෙදෙස, අංක 2, එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල (5 වන තලය) හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති.

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු)
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය)
අංක 2 ඩීල් පෙදෙස,
කොළඹ 03.

05-502

---

## නෝර්ත්ඊස්ට් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි.

2017 අප්‍රේල් 11 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 121608 යටතේ නෝර්ත්ඊස්ට් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය ඩීල් පෙදෙස, අංක 2, එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල (5 වන තලය) හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති.

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු)
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය)
අංක 2 ඩීල් පෙදෙස,
කොළඹ 03.

05-503

## ඩී පී කේ සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි.

2017 අප්‍රේල් 26 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 121892 යටතේ ඩී පී කේ සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය ඩීල් පෙදෙස, අංක 2, එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල (5 වන තලය) හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

සරවනන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂක.

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු)
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය)
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

05-504

---

## නිලෝනා ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි.

2017 මාර්තු 03 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 120534 යටතේ නිලෝනා ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 07, ටොරින්ටන් ඇවනියු, අංක 260 හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

සරවනන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂක.

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු)
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය)
අංක 2 ඩීල් පෙදෙස,
කොළඹ 03.

05-505

## ඊ - ප්ලැට්ෆෝර්ම් කළම්බු ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි.

2017 අප්‍රේල් මස 25 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීබී 5386 යටතේ ඊ - ප්ලැට්ෆෝර්ම් කළම්බු ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 02, හුණුපිටිය ලේක් රෝඩ්, අංක 117 හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

සරවනන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂක.

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු)
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය)
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

05-506

---

## විදේශ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වරාගොඩ ගල්තොට පෙදෙස ''ශ්‍රී ස්වර්ණ ශ්‍රී'' අංක 4 හි පදිංචි කුරුප්පු ආරච්චිගේ පද්මා මාලනී කුරුප්පු වන මා විසින් අංක 156/19 පත් ඉරුවේ දින පොත් අංක 1401 සහ 2016 .06.03 ලියාපදිංචි කරන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් පී ඩී ආර් සී බණ්ඩාරනායක විසින් ලියා සහතික කරන ලද අංක 3980 සහ 2016.01.04 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරනු ලබන මහනුවර හන්තාන නිවාස සංකීර්ණයේ අංක 8/A/5 හි පදිංචි ලක්ෂ්මන් කෝසල ඉද්දමල්ගොඩ යන අය පත් කළ අතර අද පටන් එය අවලංගු කරන බවත් අද පටන් එකී ඇටෝර්නි බලකරු විසින් කරන ලද කිසියම් හෝ කරුණකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ජන රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

05-508

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 අප්‍රේල් මස 17 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : එමිනන්ට් එක්ස්පෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 121576
ලියාපදිංචි කාර්යාලය : අංක 288/3, මැණික්කාගාර පාර,
කොරතොට, කඩුවෙල.

ඩබ්ලිව්. එම්. ජනක ප්‍රසාද් සෝමපාල,
සමාගම් ලේකම්.

05-516

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මහරගම, පන්සල පාර, පන්සල පටුමග, අංක 111/6, දරන ස්ථානයේ පදිංචි රාණි ගුණපාලි කරුණාරත්න (ජා. හැ. අංක 485020900 වී) වන මා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එස්. අමරකෝන් විසින් සහතික කරන ලද 2014 නොවැම්බර් මස 20 වැනි දින දරන හා අංක 1614 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මහරගම, පන්සල පාර, පන්සල් පටුමග අංක 111/6 දරන ස්ථානයේ පදිංචි දෙගම්බඩගේ චන්ද්‍රාණි මල්ලිකා කුරුප්පු (ජා. හැ. අංක 556841055 වී) යන අයට පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබේ.

එකී ඇටෝර්නි බලකරු දෙගම්බඩගේ චන්ද්‍රාණි මල්ලිකා කුරුප්පු විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වගකියනු නොලැබේ.

රාණි ගුණපාලි කරුණාරත්න,
ඇටෝර්නි බලකාරිය මගින්.

වර්ෂ 2017ක් වූ මැයි මස 02 වැනි දින කොළඹ දී ය.

05-520

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

අංක 60/1, පැලවත්ත, ගබඩා වීදිය, මාතර පදිංචි ඩන්ස්ටන් අබේවීර ගුණවර්ධන වන මා විසින් අංක 83 ඒ, ඉසුරු පෙදෙස, මාකන්දන, මඩපාත පදිංචි තිලක් අබේවීර ගුණවර්ධන මහතා වෙත ප්‍රදානය කළ කුවේට් ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දෙවන ලේකම් ඩී. එච්. පී. බී. දිසානායක මහතා විසින් සහතික කරන ලද අංක Kast/CONS/2008/POA/17 හා 2008.03.02 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙවක් පටන් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසිකොට අවලංගු කරමි. මින් පසු ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා එහි ජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

ඩන්ස්ටන් අබේවීර ගුණවර්ධන.

05-523

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කඹුරුපිටිය, මාපලාන ''ලතා සෙවන'' හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 671462092 V හිමි වර්ණකුල අනුර වන මා විසින් කොළඹ 10, මරදන, කුප්පියාවත්ත, ජයශේඛරාරාමයෙහි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 593561461 V පූජ්‍ය මාපලානේ සාන්ත හිමි වෙත ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පුෂ්පා ඩී. කග්ගොඩ ආරච්චි මහත්මිය විසින් ලියා සහතික කළ අංක 1766 සහ 2004.01.20 දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත්, මෙයින්

දැනුම් දෙන අතර මින් ඉදිරියට එකී අංක 1766 දරන ඇටෝර්නි බලපත්‍රය මත සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මාගේ වගකීමක් නොමැති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

වර්ණකුල අනුර.

2017 මැයි මස 04 වැනි දින,
කඹුරුපිටිය.

05-524

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 308/1/එෆ්, හිඹුටාන, මුල්ලේරියාව නව නගරය යන ලිපිනයේ පදිංචි ව සිටින දීප්ති ප්‍රියංකර ප්‍රනාන්දු අබේසිංහ ගුණසේකර වන මම ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. සිරිසේන විසින් සහතික කරන ලද අංක 491 හා 2008.10.23 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 308/1/එෆ් හිඹුටාන, මුල්ලේරියාව නව නගරය වන ස්ථානයේ පදිංචිව සිටින ආතාවුද මුදියන්සේලාගේ මංජුලා ප්‍රියංගනී බෝගහගෙදර (ජා. හැ. අංකය 717352297 වී) වෙත පවරා ඇති බලය අද පටන් මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන බව සියලුදෙනා වෙත මෙයින් දැනුම් දෙන අතර එකී අංක 491 දරන ඇටෝර්නි බලපත්‍රය උපයෝගි කොට ගෙන සිදු කරනු ලබන කිසිදු කටයුත්තකට මෙදින සිට මාගේ කිසිදු බැඳීමක් හෝ වගකීමක් ඇති නොවනු ඇත.

දීප්ති ප්‍රියංකර ප්‍රනාන්දු,
අබේසිංහ ගුණසේකර.

අංක 308/1/එෆ්,
හිඹුටාන,
මුල්ලේරියාව නව නගරය.

05-531

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

බෙලිඅත්ත, තංගල්ල පාර, නිලුපුල් හි පදිංචි දියොක්සෝ චෝයි සහ ආමන්ත ඉමේෂ් විජේතුංග වන මියන්ග් මූන් ඔටෝ ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් (පී. වී. 109013) දරන සමාගමෙහි අධ්‍යක්ෂකවරුන් වශයෙන් එකී සමාගම වෙනුවෙන් මාතර, තොටමුණ, වැල්ලවත්ත පාර, අංක 70 හි පදිංචි අජිත් හෙට්ටිහේවා වෙත ප්‍රදානය කරන ලද තිලිනි තෙන්නකෝන් ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ අංක 56 සහ 2015.10.22 වැනි දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකාවේ ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙන අතර, මින් ඉදිරියට එකී අංක 56 දරන ඇටර්නි බලපත්‍රය මත සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මියන්ග් මූන් ඔටෝ ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම හෝ එහි අධ්‍යක්ෂකවරුන් වන අපගේ කිසිදු වගකීක් නොමැති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආමන්ත ඉමේෂ් විජේතුංග.

05-567

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධව ප්‍රසිද්ධ දැන්වීම

සමාගම් නම : Sunsakthy Traders (Private) Limited
සමාගමේ ලියාපදිංචි දින : 2017.04.25
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 121821
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : No. 651, Hospital Road, Jaffna, Sri Lanka.

Shakthivaraii Kamalanathan,
Company Secretary.

05-583

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 05, ඇල්විටිගල මාවත, අංක 533/1ඒ, දැනට ඕස්ට්‍රේලියා වික්ටෝරියා බන්බෝරා 3083 ලර්ලයින් ST අංක 09 හි පදිංචි වැලන්ටයින් ෂෙඩන් ප්‍රනාන්දු (විදේශ ගමන් බලපත්‍ර අංක එම් 1704614) වන මට එච්. එල්. වී. එස්. ඊ. සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා අත්සන් කරන ලද අංක 112 සහ 2006.01.05 දින ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 533/1ඒ, ඇල්විටිගල මාවත, කොළඹ 05 හි පදිංචි හේරත් මුදියන්සේලාගේ ජයම්පති රවින්ද්‍ර හේරත් වෙත පවරන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර එම ඇටෝර්නි බලපත්‍රය අහෝසි කරන බවත් මින් ඉදිරියට වර්ෂ 2017 අප්‍රේල් මස 17 වැනි දින සිට ඔහු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගනුදෙනුවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් දන්වා සිටිමි.

වැලන්ටයින් ෂෙඩන් ප්‍රනාන්දු.

2017 අප්‍රේල් මස 17.

05-586

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

සමාගම් නාමය : රිවර් ෆීල්ඩ් එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 121409
ලියාපදිංචි ලිපිනය : අංක 6, මහින්දරාම පාර, ඇතුළු කෝට්ටේ, කෝට්ටේ.

සඳුන් ගමගේ,
සමාගම් ලේකම්.

05- 587

## ස්ටඩී ප්ලස් (ප්‍රයිවට්) ලිමිටඩ්

පී වී 98366

2007 අංක 7 දරන සමාගම් පනතේ 334 වගන්තියේ ප්‍රතිපාදන අනුව ඉහත සඳහන් සමාගම ණයහිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වන රැස්වීම 2017 ජුනි මස 7 වැනි දින පෙ. ව. 10.30 ට අංක 453/1, හැව්ලොක් පාර, කොළඹ 06 යන ස්ථානයේ දී පවත්වනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂක.

05-588

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ඒ ආර් එක්ස්පෝර්ට්ස් කන්සියුමර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 121838
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 93/1ඒ/1/1, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ
සංස්ථාගත කළ දිනය : 2017.04.25
අධ්‍යක්ෂ : එම්. ආර්. එම්. රුමයිzස්.

05-589

---

## සමාගමක නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර දැන්වීම

සමාගමේ පැවති නාමය : පූරණී ඉන්ස්පිරේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 19302
සමාගමේ ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 456ඒ, කෙසෙල්වත්ත, ගෝනහේන, කඩවත
සමාගමේ නව නාමය : ප්‍රෝකොන්ස් ඉන්ෆොටෙක් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

05-590

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය අනුව, අයොනික්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2017 අප්‍රේල් මස 07 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : අයොනික්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 121426
ලියාපදිංචි ලිපිනය : පාර්ක්ලන්ඩ් - 15 බී මහල, පාර්ක් වීථිය, කොළඹ 02

අධ්‍යක්ෂක මණ්ඩලය අණ පරිදි,

කෝපොරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

05-592

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2016 දෙසැම්බර් මස 16 වැනි දින සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ඉන්ඩෙව් මෝල්ෂිප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 118725
ලියාපදිංචි කාර්යාලය : අටවන මහල, ''වැලියන්ට් ටවර්ස්'', 46/7, නවම් මාවත, කොළඹ 02

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

05-593

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 මාර්තු මස 31 වැනි දින සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : වීෆ්වේ කටුනායක (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 121177
ලියාපදිංචි කාර්යාලය : රිං රෝඩ් 3, පියවර III, අපනයන සැකසුම් කලාපය, කටුනායක.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
වීෆ් වේ කටුනායක (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

05-594

## නිවේදනයයි

එම්. කේ. එම්. හෝල්ඩිංස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2017 මාර්තු 8 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : එම්. කේ. එම්. හෝල්ඩිංස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 120660
ලියාපදිංචි කාර්යාලය : 122, හැව්ලොක් පාර, කොළඹ 05

එම් කේ එම් හෝල්ඩිංස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

05-595

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ගුණවර්ධන හියුමන් රිසෝර්සස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 121826
ලියාපදිංචි කාර්යාලය : අංක 69/සී/3/3, කොස්හේන, මාපොට, කලටුවාව.
ලියාපදිංචි කළ දිනය : 2017.04.25
සමාගම් ලේකම් : දර්ශන අත්තනායක හල්ලල හේවගේ.

05-621

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : මෙඩිහෙල්ප් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 121804
ලියාපදිංචි කළ දිනය : 2017 අප්‍රේල් මස විහිහතර වැනිද
ලියාපදිංචි කාර්යාලය : 172/3, පානදුර පාර, හොරණ.

අධ්‍යක්ෂක.

05-623

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 05 වගන්තිය යටතේ දැන්වීමයි.

සමාගමේ නම : සැඩ්ස් ෆාමා (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී වී 117465
ලියාපදිංචි කළ දිනය : 2016.10.20
ලියාපදිංචි කළ කාර්යාලය : අංක 85/11, වැලියමුන පාර, හැඳල, වත්තල.

ලේකම්.

05-625

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නිවේදනයයි

වර්ෂ 2016 නොවැම්බර් මස 09 වැනි දින රෝහිත ඉන්වෙස්මන්ට් ඇන්ඩ් ප්‍රොපටි ප්‍රයිවට් ලිමිටඩ් නමින් සමාගමක් මීගහතැන්න, ජන උදන ගම්මානයේ අංක 166 යන ස්ථානයේ ස්ථාපිත කර ඇති බැවින් එකී සමාගමේ ලියාපදිංචි අංකය පී වී 117899 බව ශ්‍රී ලංකාවාසී ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

සංජීව කළුගලආරච්චි,
සමාගම් ලේකම්.

05-626

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - මාතලේ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතලේ පදිංචි අබේසිංහ ගාමිණී පොද්දල්ගොඩ යන අය බන්ධනදයි වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. පී. අයි. ගාමිණි විසින් ලියා සහතික කරන ලද 2001 සැප්තැම්බර් මස 21 දිනැති අංක 528 සහ ප්‍රසිද්ධ නොතාරිස් ජානකි කරලියද්ද නවරත්න විසින් සියල්ලම සහතික කරන ලද 2005 දෙසැම්බර් මස 28 දිනැති අංක 213 2008 මාර්තු මස 5 දිනැති අංක 563, 2010 නොවැම්බර් මස 29 දිනැති අංක 784 2005 දෙසැම්බර් 28 දිනැති අංක 216 2014 ජූලි 14 දිනැති අංක 1538 2005 දෙසැම්බර් මස 28 දිනැති අංක 210 සහ ප්‍රසිද්ධ නොතාරිස් අයි. එච්. බී. ඩී. විජයකෝන් විසින් දෙකම සහතික කරන ලද 2003 මාර්තු මස 26 දිනැති අංක 3796 2004 සැප්තැම්බර් මස 1 දිනැති අංක 3905 සහ ප්‍රසිද්ධ නොතාරිස් ජානකි කරලියද්ද නවරත්න විසින් සියල්ලම සහතික කරන ලද 2005 දෙසැම්බර් මස 28 දිනැති අංක 212 2008 මාර්තු මස 5 දිනැති අංක 564 2010 නොවැම්බර් මස 29 දිනැති අංක 785 2005 දෙසැම්බර් මස 28 දිනැති අංක 214 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති පහත උපලේඛනයන්හි සඳහන් දේපළ සහ පරිශ්‍රය වර්ෂ 2017ක් වූ ජූනි මස 06 වැනි දින දේපළ පිහිටි ස්ථානයේ දී පහත සඳහන් කර ඇති වේලාවන්හි දී සෙලාන් බැංකුව පී එල් සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

**උපලේඛනය 1**

වෙන්දේසිය පැවැත්වීමට නියමිත වේලාව පෙ. ව. 9.30

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවත පත්තුවේ පරණකුරු කෝරළේ මීදෙනිය පිහිටි බලයලත් මිනින්දෝරු ජේ. එම්. ජයසේකර විසින් සාදන ලද 1999.02.19 දිනැති අංක 2112 සැලැස්මේ සඳහන් වරකාපුස්හේන හෙවත් කඩුල්ලගාවා හේන නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කැබැල්ල ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් විසි අටක් (අ. 1 රූ. 1 පර්. 28) ක් වූ විශාල ගොඩනැගිල්ල සහ එහි පිහිටි වෙනත් සියලු දේ ද සමග වේ.

*දේපළට පිවිසීම.* - නුවර කොළඹ පාරේ කෑගල්ල නගරයේ සිට බුලත්කොහුපිටිය පාරෙන් කිලෝමීටර් 65ක් ගිය විට හෙට්ටිමුල්ල කඩවීදිය හමුවේ. එතැන් සිට වමට ඇති හපුවිට පාරෙන් කිලෝ මීටර් 0.8 ක් ගියවිට දකුණු දෙසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

**උපලේඛනය 2**

වෙන්දේසිය පැවැත්වීමට නියමිත වේලාව - ප. ව. 1.00

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණු කොට්ඨාසයේ මැදසිය පත්තුවේ උකුවෙල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් සාදන ලද 1988 ජූනි මස 25 දිනැති අංක 2093 ඒ සැලැස්මේ නිරූපනය වන උකුවෙල එස්ටේට් හි කොටසක් ලෙස හඳුන්වන සහ නම් කරනු ලබන ඉඩම් කොටසේ ලොට් 1 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කැබැල්ල ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 16.5) ක් විශාල බිම ගස් වගා සහ පවත්නා මාර්ග අයිතිය සහ එකී සැලැස්මේ පෙන්නුම් කරන පරිදි ලොට් 37 ලකුණු කළ මාර්ගය තළ උඩින් සහ දිගේ ප්‍රවේශය සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම වේ.

එකී ලොට් 1 ලකුණු කළ ඉඩම් කොටස දැන් නැවත මැන පහත සඳහන් පරිදි විස්තර කර ඇත :-

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණු මැදසිය පත්තුවේ උකුවෙල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඊ. වී. සිරිසුමන විසින් සාදන ලද 2005 දෙසැම්බර් මස 18 දිනැති අංක 6535 සැලැස්මේ නිරූපනය වන උකුවෙල එස්ටේට් හි කොටසක් ලෙස හඳුන්වන සහ නම් කරනු ලබන ඉඩම් කොටසේ ලොට් ඒ ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කැබැල්ල ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 16.5) ක් විශාල බිම ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම වේ.

*දේපළට පිවිසීම.* - මාතලේ නගරයේ සිට උකුවෙල පාර ඔස්සේ ගියවිට දකුණු දෙසට වන්නට 5 වන පටුමග හමුවේ. එම පටුමගේ මීටර 100 ගමන්කළ විට අවසානයට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

**උපලේඛනය 3**

වෙන්දේසිය පැවැත්වීමට නියමිත වේලාව ප. ව. 1.20

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණු මැදසිය පත්තුවේ උකුවෙල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. පී. ඩබ්ලිව්. ගිරාගම විසින් සාදන ලද 1991 අගෝස්තු මස 04 වැනි දිනැති අංක 2341 සැලැස්මේ නිරූපනය වන මඩමේ වත්ත සහ වැලිගොඩවත්ත ලෙස හඳුන්වන සහ නම් කරනු ලබන ඉඩම් කොටසේ ලොට් 4 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කැබැල්ල ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20) ක් විශාල බිම ගස් වගා සහ පවත්නා මාර්ග අයිතිය සහ එකී සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මාර්ගය තළ උඩින් සහ දිගේ ප්‍රවේශය සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම වේ.

එකී ලොට් 4 ලකුණු කළ ඉඩම් කොටස දැන් නැවත මැන පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණු මැදසිය පත්තුවේ උකුවෙල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඊ. වී.

සිරිසුමන විසින් සාදන ලද 2005 දෙසැම්බර් මස 18 දිනැති අංක 6536 සැලැස්මේ නිරූපනය වන මඩමේවත්ත සහ වැලිගොඩේවත්ත ලෙස හඳුන්වන සහ නම් කරනු ලබන ඉඩම් කොටසේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20)ක් විශාල බිම ගස් වගා සහ මාර්ග අයිතිය සහ එකී සැලැස්මේ නිරූපනය වන අඩි 10ක් පළල පාර තුළ උඩින් සහ දිගේ ප්‍රවේශ මාර්ගය සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම වේ.

*දේපළට පිවිසීම.* - මාතලේ නගරයේ සිට මාතලේ උකුවෙල පාර ඔස්සේ තවලංකොය හමුද කඳවුර දක්වා ගොස් දකුණු පසින් වන්නට ඇති එගොඩවත්ත පාරෙන් 200 ගියවිට සමගි මාවත පසුකර මීටර් 10 යනවාත් සමගම දකුණු දෙසට වන්නට බොරලු පාරක් හමුවේ. එම පාර ඔස්සේ මීටර් 100 යනවිට වයි හන්දියත් හැරී වමට මීටර් 30 ගිය විට හැරවුම් කවය අසල මෙම දේපළ පිහිටා ඇත.

### උපලේඛනය 4

වෙන්දේසිය පැවැත්වීමට නියමිත වේලාව ප. ව. 1.40

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණු මැදසිය පත්තුවේ උකුවෙල පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. පී. ඩබ්ලිව්. ගිරාගම විසින් සාදන ලද 1983.10.05 නිවැරදිව 1983.10.03 වැනි දිනැති අංක 125 සැලැස්මේ නිරූපනය වන උකුවෙල එස්ටේට් ලෙස හඳුන්වන සහ නම් කරනු ලබන ඉඩම් කොටසේ ලොට් ඒ ලෙස නිරූපනය වන බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම දෙකක් (අ. 0 රූ. 0 පර්. 23.2)ක් විශාල බිම ගස් වගා සහ පිහිටි වෙනත් සියලු දේ සමග වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණු මැදසිය පත්තුවේ උකුවෙල පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. පී. ඩබ්ලිව්. ගිරාගම විසින් සාදන ලද 1985.04.18 වැනි දිනැති අංක 125ඒ සැලැස්මේ සඳහන් උකුවෙල එස්ටේට් ලෙස හඳුන්වන සහ නම් කරනු ලබන ඉඩමේ ප්‍රමාණයෙන් පර්චස් දෙළහක් (අ. 0 රූ. 0 පර්. 12) ක් විශාල බිම ගස් වගා සහ පිහිටි වෙනත් සියලු දේ සමග වේ.

පෙර කී ඉඩම් කොටස් දූන් නැවත මැන සහ එකතුකර මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ දකුණු මැදසිය පත්තුවේ උකුවෙල පිහිටි බලයලත් මිනින්දෝරු යූ. එච්. බී. කේ. එම්. ටී. අංගම්මන විසින් සාදන ලද 2003.03.05 වැනි දිනැති අංක 1063 දරන සැලැස්මේ සඳහන් උකුවෙල එස්ටේට් ලෙස හඳුන්වන සහ නම් කරනු ලබන ඉඩමේ ප්‍රමාණයෙන් පර්චස් තිස් පහයි දශම දෙකයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 35.20) ක් විශාල බිම ගොඩනැගිලි වගා සහ පිහිටි වෙනත් සියලු දේ සමග වේ.

*දේපළට පිවිසීම.* - උකුවෙල හන්දියෙන් දුම්රිය හරස් මාර්ගයෙන් මාතලේ පාර ඔස්සේ මීටර් 300ක් ගිය විට වම් පසට ඇති පුබුදු මාවතෙන් මීටර් 50ක් ගොස් මහජන ක්‍රීඩාංගනයට පෙර වමට හැරී එගොඩවත්ත පාරෙන් මීටර් 75 ක් ගිය විට වම් දෙසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

### උපලේඛනය 5

වෙන්දේසිය පැවැත්වීමට නියමිත වේලාව ප. ව. 2.00

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණු මැදසිය පත්තුවේ උකුවෙල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් සාදන ලද 1988 ජූනි මස 25 වැනි දිනැති අංක 2093 ඒ සැලැස්මේ නිරූපනය වන උකුවෙල එස්ටේට් හි කොටසක් ලෙස හඳුන්වන සහ නම් කරනු ලබන ඉඩම් කොටසේ ලොට් 14 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස දූන් නැවත මැන පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණු මැදසිය පත්තුවේ උකුවෙල පිහිටි බලයලත් මිනින්දෝරු ඊ. වී. සිරිසුමන විසින් සාදන ලද 2005 දෙසැම්බර් මස 18 දිනැති අංක 6538 සැලැස්මේ නිරූපනය වන උකුවෙල එස්ටේට් හි කොටසක් ලෙස හඳුන්වන සහ නම් කරනු ලබන ඉඩම් කොටසේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් අ. 0 රූ. 0 පර්. 15ක් විශාල බිම ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග වේ.

*දේපළට පිවිසීම.* - උකුවෙල හන්දියෙන් දුම්රිය හරස් මාර්ගයෙන් මාතලේ පාර ඔස්සේ මීටර් 300 ක් ගිය විට වම් පසට ඇති ගුණසේන පෙදෙසෙහි 5 වන පටුමගෙන් මීටර් 150ක් ගොස් මහජන ක්‍රීඩාංගනයට පසු වමට හැරී මීටර් 75ක් ගිය විට වම් දෙසට වන්නට මෙම දේපළ පිහිටා ඇත. බුද්ධික කන්ස්ට්‍රක්ෂන් කම්පැනි හි ගබඩා සංකීර්ණය ඉදිරිපිට

යෝජනා සම්මුති දැන්වීම .- 2016.10.14 දිනැති *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2016.10.20 දිනැති ඩේලිමිරර් ලංකාදීප සහ 2016.10.10 දිනැති තිනක්කුරල් පුවත්පත් හි පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
4. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
6. සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය,
7. ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද

ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

සහකාර සාමාන්‍යාධිකාරි - නීති සෙලාන් බැංකුව පීඑල්සී අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456485 011- 2456479.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9- අයි හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකථන අංක 071- 4318252 - 011- 2173282.

05-624

---

**ඉබ්බාගමුව, පොල්ගොල්ල ගමේ පිහිටි හිස් ඉඩමක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

කොළඹ දිසා අධිකරණයේ දී

සෙලාන් බෑන්ක් පීඑල්සී,
(කලින් සී/ස සෙලාන් බැංකුව නමින් හඳුන්වන ලද)
සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර,
කොළඹ 03.

නඩු අංක - DMB/00158/2011 ........................පැමිණිලිකරු.

එදිරිව

සංජය සමීර ද සිල්වා
620/1, ඔතුකුඹුර මාවත,
යන්තම්පලාව, කුරුණෑගල.

...........................විත්තිකරු.

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත්කර ඇති දේපල විකිණීමේ අධිකාරි පත්‍රයට අනුව ඉහත විත්තිකරු විසින් රුපියල් දහනව ලක්ෂ හැත්තෑ දහස් හයසිය හතලිස් පහයි ශත දහනවයක (රු. 1,970,645/19) මුදලක් සහ වර්ෂ 2011.02.16 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් පැමිණිලිකරුට ගෙවා නිම කරන දින දක්වා එකී මුදල මත සියයට විසිනවයක (29%) ක වාර්ෂික පොලියක් සහ මෙම නඩුවේ තක්සේරු නඩු ගාස්තු ද පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු යැයි නියෝග කර එම මුදල් අය කර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ විස්තර වන දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කර ඇති හෙයින් ඉබ්බාගමුව, පොල්ගොල්ල ගමේ හිද්දන හංදියේ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහලොවක් (අ:0 රූ:0 පර්:15) විශාල හිස් ඉඩම 2017 ජුනි මස 13 වැනි දින පස්වරු 12.30 ට එකී දේපල පිහිටි ස්ථානයේ දී මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපලට පිවිසෙන මාර්ගය.-* කුරුණෑගල සිට දඹුල්ලට යන මහා මාර්ගයේ ඉබ්බාගමුව පසුකර කි. මී. 3 ක් පමණ ගිය විට හමුවන පොල්ගොල්ල ගමේ හිද්දන හංදියේ කුරුණෑගල දඹුල්ල මහා මාර්ගයට මුහුණලා වම් පැත්තට මෙම දේපල පිහිටා තිබේ. හිද්දන ප්‍රාදේශීය සභා පාරට එක් මුහුණතක් දිස්වේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසියේදී දේපළ ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් මුදල් වෙන්දේසිකරු වන මා වෙත ගෙවිය යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසියේ දී මුළු ගැනුම් මුදලෙන් සියයට විසිපහක (25%) මුදලක්. ඉතිරි සියයට හැත්තෑපහක (75%) ක මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.
2. වෙන්දේසිය පැවැත්වීම සඳහා රජයේ ගැසට් පත්‍රයේ සහ දිනපතා පුවත්පතක වෙන්දේසි දැන්වීම් ප්‍රසිද්ධ කිරීමේ ගාස්තු ඇතුළු වෙන්දේසිය පැවැත්වීම සඳහා වන සියලුම වියදම්.
3. ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු සියයට එකක (1%) වෙළෙඳ බද්ද.
4. විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නීතිඥ ගාස්තු.
5. වෙන්දේසිකරුගේ කොමිස් මුදල සියයට දෙකහමාරක් (2 1/2%).
6. පොලිස් නිලධාරින්ට බටා මුදල්, ලිපිකරු හා සෝෂක ගාස්තු.

**ඉහත කී උපලේඛනය**

වයඹ පලාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉහළ විසිදෙක කෝරළේ හිරියාල හත්පත්තුවේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්ගොල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2016.12.26 දිනැති අංක 2728 දරන සැලැස්මේ නිරූපනය වන පාලුපොල්ගොල්ල එස්ටේට් නමැති ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 33 ලකුණු කළ (මෙම උපලේඛනයේ සවිස්තරව විස්තර කරනු ලබන බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2006.12.08 දිනැති අංක 2706 බී සැලැස්මේ නිරූපණය වන ලොට් 1 හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට: මෙහි සඳහන් ලොට් 34ද, නැගෙනහිරට: මහා මාර්ගය (කුරුණෑගල සිට දඹුල්ල) ද, දකුණට: මෙහි සඳහන් ලොට් 83 සහ බස්නාහිරට: මෙහි සඳහන් ලොට් 32 ද යන මායිම් තුළ එකී අංක 2728 සැලැස්ම අනුව පර්චස් පහළොවක් (අ:0 රූ:0 පර්:15) නොහොත් හෙක්ටයාර් 0.03794 ක් විශාල ඉඩම.

එකී අංක 2728 සැලැස්මේ නිරූපනය වන ලොට් 77 ලකුණු කළ මාර්ගය සඳහා වෙන් කිරීම සහ පහත විස්තර කරනු ලබන

ලොට් 13 තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ සියලු වෙනත් අයිතීන් සමඟ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉහළ විසිදෙක කෝරළේ හිරියාල හත්පත්තුවේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්ගොල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2006.12.26 දිනැති අංක 2728 දරණ සැලැස්මේ නිරූපනය වන පාලුපොල්ගොල්ල එස්ටේට් නමැති ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩමේ ලොට් 13 ලකුණු කළ (මීටර් 6 ක් පළල පාර සහ කාණුව සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට: ලොට් 51, 90, 50, 49, 48, 47, 46, 82, 39, 38, 37 සහ 35 ද, නැගෙනහිරට: මහා මාර්ගයද (කුරුණෑගල සිට දඹුල්ල), දකුණට: ලොට් අංක 34, 32, 84, 31, 30, 29, 28, 27, 26, 25 සහ 24 ද, බස්නාහිරට: ලොට් 23, 78 සහ 52 ද යන මායිම් තුළ එකී අංක 2728 සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් බිංදුවයි පහයි දශම තුනයි බිංදුවක් (අ:0 රූ:1 පර්:05.30) නොහොත් හෙක්ටයාර් 0.11457 විශාල ඉඩම, මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 927/08 යටතේ ලියාපදිංචි කර ඇත. එකී ඉඩමේ කැබලි පහත සඳහන් ඉඩමේ අතුරු බෙදීම් වන අතර ලියාපදිංචිය එයට සම්බන්ධ කළ හැක.

වයඹ පලාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉහළ විසිදෙක කෝරළේ හිරියාල හත්පත්තුවේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්ගොල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2006.12.08 දිනැති අංක 2706 බී දරන සැලැස්මේ නිරූපනය වන පාලුපොල්ගොල්ල එස්ටේට් නමැති ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට: ඇල, එම්. කරුණාරත්න සහ පී. මුතු බණ්ඩා විසින් හිමිකම් කියනු ලබන උදෙරිපොල, පොල්ගොල්ල පන්සල විසින් හිමිකම් කියනු ලබන පිංකුඹුර, රජයේ ඉඩම, පොල්ගොල්ල පන්සලේ පන්සල්වත්ත ඉඩම සහ ඒ ඉක්බාර් ගේ ඉඩමද, නැගෙනහිරට: මහා මාර්ගයද (කුරුණෑගල සිට දඹුල්ල), දකුණට: පොල්ගොල්ල හිද්දන පාර (ප්‍රාදේශීය සභා පාර) සහ ලොට් 3, 4 සහ 2 ද, බස්නාහිරට: අංක 1729 සැලැස්මේ නිරූපනය වන ඉඩමේ කොටස සහ ඇල ද යන මායිම් තුළ එකී අංක 2706බී සැලැස්ම අනුව අක්කර නවයයි රූඩ් එකයි පර්චස් තිස් එකයි දශම දෙකයි පහක් (අ:9 රූ:1 පර්:31.25) නොහොත් හෙක්ටයාර් 3,82225 ක් විශාල ඉඩම, මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 846/237 යටතේ ලියාපදිංචි කර ඇත.

එන්. ජේ. එදිරිසිංහ,
මුළු දිවයිනට සාමවිනිසුරු,
කොළඹ දිසා අධිකරණයේ
උසාවි කොමසාරිස්,
වෙන්දේසිකරු හා තක්සේරුකරු

2017 මැයි මස 03 වැනි දින දී ය.
අංක 244, පරණ කොට්ටාව පාර,
ඇඹුල්දෙණිය, නුගේගොඩ.
දුරකථන අංකය. 0777-453463

05-477

## ඩී එෆ් සී සී බැංකුව පී එල් සී
## (ඩී එෆ් සී සී වර්ධන බැංකුවෙහි අනුප්‍රාප්තික)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පණතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 248 දරණ උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහ ප්‍රදේශීය සභා සීමාවට අයත්, උතුරු අම්බලන්තොට ග්‍රාම නිළධාරී වසමේ, අම්බලන්තොට නගරයේ, කොට්ඨාශ අංක 07 හි පිහිටා ඇති, බලයලත් මිනින්දෙරු වයි එම් පී බී කරුණාසුන්දර විසින් සාදන ලද 1973 අගෝස්තු 07 වන දිනැති අංක 211 A දරණ පිඹුරේ ගල්ලැලිතොට සහ දංගහවත්ත යන ඒකාබද්ධ ඉඩම්වල ලොට් අංක 01, 02, 15, 16, 34, 35, 36, 31, 32, 33, 37 සහ 38 ලෙස දැක්වෙන පී බී ඉලංගසිංහ විසින් සාදන ලද, 2007 මාර්තු 18 වන දිනැති අංක Ha/6004 දරණ පිඹුරේ ලොට් අංක A ලෙස දැක්වෙන නැවත මනින ලද සහ උප කොටස් කරන ලද සීමා නිර්ණය කර බෙද වෙන් කරන ලද බිම් කට්ටිය.

*ඉඩමේ ප්‍රමාණය.-* අක්: 01 රූඩ්: 02 පර්: 04 ඉහත කී අංක Ha/6004 දරන පිඹුරට අනුව එහි පිහිටි පස, වගාවන්, ගොඩනැගිලි සහ සියල්ල සහිතව

ඉහත කී අම්බලන්තොට නගරයේ, කොට්ඨාශ අංක 07 හි පිහිටා ඇති, බලයලත් මිනින්දෝරු වයි එම් පී බී කරුණාසුන්දර විසින් සාදන ලද 1973 අගෝස්තු 07 වන දිනැති අංක 211A දරණ පිඹුරේ ගල්ලැලිතොට සහ දංගහවත්ත යන ඒකාබද්ධ ඉඩම්වල ලොට් අංක 01, 02, 15, 16, 34, 35, 36, 31, 32, 33, 37 සහ 38 ලෙස දැක්වෙන පී බී ඉලංගසිංහ විසින් සාදන ලද, 2007 මාර්තු 18 වන දිනැති අංක Ha/6004 දරණ පිඹුරේ ලොට් අංක B ලෙස දැක්වෙන නැවත මනින ලද සහ උප කොටස් කරන ලද සීමා නිර්ණය කර බෙද වෙන් කරන ලද බිම් කට්ටිය.

*ඉඩමේ ප්‍රමාණය.-* අක්: 01 රූඩ්: 00 පර්: 05 ඉහත කී අංක Ha/6004 දරන පිඹුරට අනුව එහි පිහිටි පස, වගාවන්, ගොඩනැගිලි සහ සියල්ල සහිතව

හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් සනත් නානායක්කාර විසින් සහතික කරන ලද, 2014 අගෝස්තු මස 06 දිනැති අංක 248 දරණ උකස්කරය ප්‍රකාර, හම්බන්තොට පදිංචි උඩුගම කෝරළලාගේ ධනුෂිකා තරංගනී පෙරේරා සහ සමන් පන්ඩුල හේවා කොඩුප්පිලි ධර්ම විල්ලා විසින්

ඩී එෆ් සී සී බැංකුව පී එල් සී (ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික) ට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු

නිසියාකාරව ඉෂ්ඨ නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017 ජුනි මස 06 වෙනි (අඟහරුවාද) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය* .- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙක හමාර),
4. රු. 125,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1000,
6. විකිණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම්ද වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක: 011 - 2371371

" ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි "

ෂොක්මන් සහ සමරවික්‍රම,<br>
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,<br>
වසර 125 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*<br>
අංක 24, ටොරින්ටන් පාර,<br>
මහනුවර.<br>
දුරකථන අංකය : 081 - 2227593<br>
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371<br>
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*<br>
අංක 290, හැව්ලොක් පාර,<br>
කොළඹ 05<br>
දුරකථන අංක : 011-2502680, 2585408<br>
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176<br>
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

05-525

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී**

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේදී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, (මහනුවර ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, කඩවත්සතර ප්‍රාදේශීය සභා සීමාවේ, කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩවත්සතර උඩබෝවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උඩබෝවල ගෝනාවත්තේ පිහිටා ඇති , ද සොයිසා එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ආර්. එල්. කේ. ජයසුන්දර විසින් මැන සාදන ලද වර්ෂ 2007 ක් වූ ජනවාරි මස 14 සහ 15 වැනි දිනැති අංක ජේ 2487 දරන පිඹුරේ ලොට් II වශයෙන් බෙද වෙන් කරන ලද ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ වැවිලි සමග අනෙකුත් සෑම සියලු දේත් සමග ලොට් 13 ලෙස සඳහන් කර ඇති ඉඩම මතින් සහ ඒ ඔස්සේ වන මාර්ග අයිතිවාසිකම සමග ද වේ.

(බිම් ප්‍රමාණය : අ. 0 රූ. 0 පර්. 15.71) වර්ෂ 2017 ක් වූ ජුනි මස 07 වැනි දින පෙ. ව. 10.30 ට

*දේපළට පිවිසෙන මාර්ගය*.- මහනුවර නගරයේ සිට කුණ්ඩසාලේ පාරේ තැන්නේකුඹුර හන්දිය දක්වා කි. මී. 7ක් පමණ ගමන් කර නැවත රන්දෙනිගල පාරේ (රජ මාවත) කි. මී. 5.2ක් පමණ ගමන් කර වමට හැරී රිවර් විව් ගාර්ඩන් පාරේ (වාහන ගමන් කළ හැකි තාර පාර) මීටර් 700ක් පමණ ගමන් කළ පසු මාර්ගය අද්දර විෂයගත දේපළ පිහිටා ඇත.

අලුත්ගේ මුදියන්සේලාගේ නිලන්ත ආනන්ද ජයරත්න යන අය බන්ධනදයි සහ උකස්කරු වශයෙන් ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් නිල්නි වැගොඩපොල විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016.01.19 දිනැති අංක 1702 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2017.05.05 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් සහ එදින *ගැසට් පත* ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,

6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තු රු. 1,500 ක් ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදල තොරතුරු ප්‍රධානී - ණය අයකර ගැනීම්, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 - 4667230, 011- 4667237, 011-4667229.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ,
මහනුවර.
දුරකථන/ෆැක්ස් : 081-2210595
ජංගම දුරකථන අංකः 071-4755974, 071-4962449.

05-599

---

## පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.

### 1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේදී එකී දේපළ පිහිටි ස්ථානයේදී එහි දක්වා ඇති වේලාවේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ, පස්දුන් කෝරළේ, ඉද්දගොඩ පත්තුවේ, දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ, දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, දොඩන්ගොඩ බටහිර 800 එෆ් ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ, පිලෝමිනා වත්ත, 9 වන පටුමග, වරිපනම් අංක 44 දරන ශාන්ත පිලෝමිනා එස්ටේට් නැමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්.සෙනෙවිරත්න විසින් මැන සාදන ලද වර්ෂ 1984/09/19 දිනැති අංක 3944 දරන පිඹුර (බලයලත් මානක ඩබ්ලිව්. සෙනෙවිරත්න විසින් මැන සාදන ලද වර්ෂ 1984/02/10 දිනැති අංක 3791 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද කොටසකි.) ප්‍රකාරව ලොට් 205 වශයෙන් බෙද වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සමග අනෙකුත් සෑම සියළු දේත් සමඟ ඉහත අංක 3944 පිඹුර ප්‍රකාරව ලොට් 29 සහ වඩා නිවැරදි ලෙස ලොට් ආර් 29 ද සහ ලොට් 32 හෙවත් වඩාත් නිවැරදි ලෙස ලොට් ආර් 32 යන කොටස් මතින් සහ ඒ ඔස්සේ වන මාර්ග අයිතිවාසිකම් ද සමග වේ.

(බිම් ප්‍රමාණය අ. 0- රූ. 0- පර්. 22.5)
වර්ෂ 2017 ක්වූ ජූනි මස 06 වැනි දින පෙ.ව.11.00 ට

*දේපළට පිවිසෙන මාර්ගය.-* කොළඹ සිට කොළඹ-හම්බන්තොට වැල්ලවාය ඒ2 අධිවේගී මාර්ගය දිගේ කි.මී.45 කණුව පසුකර මීටර් 200ක් පමණ ගිය පසු කටුකුරුන්ද හන්දිය වෙත ලඟා වේ. එතැන් සිට වමට හැරී මතුගම පාරේ 4/3 බෝක්කුව පසුකර මීටර් 200ක් පමණ ගිය පසු වම් පැත්තේ 9 වන පටුමග හමුවන අතර එම පාරේ වයි හන්දිය පසුකර මීටර් 150 ක් පමණ ගමන් කර දකුණට හැරී මීටර් 125ක් පමණ ගමන් කළ පසු දකුණු අත පැත්තේ විෂයගත දේපළ පිහිටා ඇත.

විජයමාන්න ලියනාරච්චිලාගේ කුමුදුනී මාරිස්ටෙලා බන්ධනදයී ලෙස සහ මරීනා රෝස් වර්ජිනියා පෙරේරා බන්ධනදයී/උකස්කරු වශයෙන් ලියාපදිංචි අංක පී.කිව් 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් පී.එස්.එන්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016/05/17 දිනැති අංක 5757 දරන ප්‍රාථමික වල උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය-* සඳහා 2017/05/05 වන දින ලක්බිමද, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත් පත් සහ එදින ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සදහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්)
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්)
4. ප්‍රචාරක වියදම් ද
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තු රු. 1,500/-

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදල තොරතුරු ප්‍රධානී - ණය අයකර ගැනීම්, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී.ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03. දුරකථන 011-4667230, 011-4667237, 0114667229.

අයි. ඩබ්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු,

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
දුරකථන/ෆැක්ස් 081-2210595
ජංගම දුරකථන 071-4755974, 071-4962449

05-598

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.